කැලණිය අධ්‍යාපන කලාපය

දෙවන වාර පරීක්ෂණය - 2017

11 ශ්‍රේණිය　　　　ඉතිහාසය - 1　　　　කාලය පැය 01 යි

සැලකිය යුතුයි

* සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

* අංක 1 - 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරු අතුරින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.

* ඔබට සැපයෙන පිළිතුරු, පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ ( × ) ලකුණ යොදන්න.

1. ශ්‍රී ලංකාවේ ශාසන ඉතිහාසය ඉගෙන ගැනීමේදී වඩාත් වැදගත් කෘතිය කුමක් ද ?

i බෝධි වංශය　　　　ii නිකාය සංග්‍රහය

iii දාඨා වංශය　　　　iv රාජාවලිය

2. ගොඩබිම ජීවත්වන බෙල්ලන් තම ආහාරය පිණිස වැඩි වශයෙන් යොදා ගත්තේ කුමන දේශගුණ කලාපයක ජීවත් වූ ප්‍රාග් ඓතිහාසික වැසියන් ද ?

i අර්ධ ශුෂ්ක කලාපයේ　　　　ii කඳුකර වියළි අතරමැදි කලාපයේ

iii පහතරට තෙත් කලාපයේ　　　　iv පහතරට වියළි කලාපයේ

3. රතු පැහැති ගුරුගල් ආලේප කරන ලද දෙකට බෙදෙන ලෙස සිදුරු විද ඇති මිනිස් හිස් කබලක් හමුවී ඇත්තේ කුමන ප්‍රදේශයෙන් ද ?

i පොතාන ගල් ගුහාවෙන්　　　　ii බුන්දල වැල්ලෙ ගංගොඩින්

iii බටදොඹ ලෙනෙන්　　　　iv රාවණා ඇල්ල ගල් ගුහාවෙන්

4. ප්‍රදේශීය පාලකයෙකු පොචනි රජ වශයෙන් හඳුන්වා ඇත්තේ කුමන සෙල්ලිපියේ ද?

i ඇඹුල් ඇඹේ　　　　ii කොත්ගල් කන්ද

iii යටහලෙන　　　　iv පෙරිය පුලින්කුලම

5. දේවානම්පියතිස්ස රජු ප්‍රදේශීය පාලකයින් අතර සුහදතාවය ගොඩ නැගීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ගයක් සඳහන් පිළිතුර තෝරන්න.

i ඉන්දියාව සමඟ සබඳතා ගොඩ නැගීම.

ii ශ්‍රී මහා බෝධි ශාඛා දිවයිනේ විවිධ ප්‍රදේශවල රෝපණය කිරීම.

iii දිවයිනේ විවිධ ප්‍රදේශවල දාගැබ් ගොඩ නැගීම.

iv විවිධ ප්‍රදේශවල පාලන කටයුතු සඳහා නිලධාරීන් පත් කිරීම.

6. පළමුවන ගජබා රජුගේ විදේශ සබඳතා විස්තර වන පිළිතුර කුමක් ද?

i විසි වතාවක් චීනයට තානාපතිවරු යැවීම.

ii පාණ්ඩ්‍ය දේශය සමග විවාහ සබඳතා ඇති කර ගැනීම.

iii පත්තිනි දේවාලයක් විවෘත කිරීමට චේර රාජ්‍යයට යාම.

iv රෝමානු දේශයට තානාපතිවරු යැවීම.

7. සෙල්ලිපි වල පූගය, නියමස්ථාන වැනි වචන වලින් හඳුන්වා ඇත්තේ ?

i ප්‍රාදේශීය පාලන ඒකකය　　ii කර්මාන්ත පැවති ස්ථානය

iii වෙළඳාම් කළ ස්ථානය　　iv වෙළඳ සංවිධානය

8. ලංකා ඉතිහාසයේ ප්‍රථම සංවිධානාත්මක සටන් ව්‍යාපාරයට නායකත්වය දෙන ලද්දේ කුමන රජතුමා ද ?

i ධාතුසේන　　ii දුටුගැමුණු

iii වසභ　　iv වළගම්බා

9. සීගිරියේ නාග පබ්බත විහාරයේ ඇති කැටයමින් කුමන කාර්යයක් පිළිබඳ තොරතුරු ලබා ගත හැකි ද ?

i වී ගොවිතැන　　ii සත්ව පාලනය

iii හේන් ගොවිතැන　　iv ඇත්දළ කර්මාන්තය

10. ධර්මයේ කොටස් මතකයේ තබාගත් භික්ෂූන් වහන්සේලා අතීතයේ හඳුන්වන ලද්දේ කුමන නමකින් ද ?

i අත්තේ වාසික　　ii සද්ධිවිහරිය

iii භාණකවරු　　iv ථෙර

11. ක්‍රි. පූ. 1350 දී පමණ සොහොන් ගර්භයකට මැටි නළයක් සවිකර තිබීමෙන් හෙළි වන්නේ

i දහනය සඳහා ඔක්සිජන් ලබා දී ඇති බවය.

ii නළය දිගේ සොහොන් ගර්භයට ජලය වත් කර ඇති බවය.

iii මැටි කර්මාන්තය දැන සිටි බවය.

iv සොහොන් සකස් කිරීමේ චාරිත්‍රය දැන සිටි බවය.

12. පහත අ සහ ආ තීරු දෙක නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| අ | ආ |
|---|---|
| i වැව් බැම්මේ සිදුවන බාදනය වැළැක්වීම. | A බිසෝ කොටුව |
| ii වැවේ ජලය ඇළ මාර්ගයට මුදා හැරීම. | B රළපනාව |
| iii වැවේ ජලය රඳවා තබා ගැනීම. | C වැව් බැම්ම |
| iv සොරොව්වට ඇති වන පීඩනය වැළැක්වීම. | D සොරොව්ව |

i B C D A　　ii A B C D　　iii D C B A　　iv B D C A

13. අතීත ශිල්පීන් වජ්‍ර චුම්බට භාවිතා කර ඇත්තේ

i ගොඩනැගිලිවල ගිලා බැසීම වළක්වාලීමටය.

ii අකුණු සැර වලින් ආරක්‍ෂාවීමටය.

iii දාගැබ් අලංකාර කිරීමටය.

iv ගොඩනැගිලිවල කල් පැවැත්ම සඳහාය.

14. ලංකාවේ මැටි කර්මාන්තයේ දියුණුව විදහාපාන වර්ණාලිප්ත උළු හමු වී ඇත්තේ

i ජේතවන කැණීම් වලිනි
ii ඇතුළු නුවර කැණීම් වලිනි
iii අභය ගිරි කැණීම් වලිනි
iv ලෝවාමහාපාය කැණීම් වලිනි

15. නිශ්ශංකමල්ල රජතුමා විසින් ප්‍රධාන මාවත්වල ගව්වෙන් ගව්ව දුර සිටුවීමට නියෝග කළ කණු හඳුන්වනු ලබන්නේ කුමන නමකින් ද?

i ගාවුත කණු
ii යොදුන් කණු
iii උසබ කණු
iv කිලෝමීටර් කණු

16. කිරිමඩු යාගය හා සම්බන්ධ තොරතුරු ලබා දෙන පැරණි දේවාලය හමු වී ඇත්තේ කුමන ප්‍රදේශයෙන් ද ?

i කුරුවිට බටදොඹ ලෙනින්
ii හම්බන්තොට උඩමළලින්
iii රත්නපුර ගල්පායෙන්
iv රත්නපුර රංචා මඩමින්

17. පැරණි සමාජයේ ජීවත් වූ ප්‍රභූන් හා සාමාන්‍ය ජනතාව අතර සබඳතා ගොඩ නැගීමට උපකාරී වූ පිරිසක් ඇතුළත් පිළිතුර කුමක් ද ?

i වෙළෙන්දන් හා ගම් ප්‍රධානීන්
ii රජයේ නිලධාරීන් හා මහා සංඝරත්නය
iii සාමාන්‍ය රජයේ නිලධාරීන් හා වෙළෙන්දන්
iv ගොවියන් හා වෙළඳ ශ්‍රේණි නායකයින්

18. පැරණි සෙල්ලිපි වල මේකාප්පර්, දණ්ඩනායක වැනි වචන වලින් හඳුන්වා ඇත්තේ

i වෙළෙන්ද නායකයින් ය
ii දඩුවම් නියම කරන්නන් ය
iii නීති සම්පාදකයින් ය
iv ආරක්‍ෂක නිලධාරීන් ය

19. මෙරට කාසි භාවිතය ආරම්භ වී ඇත්තේ

i ක්‍රි. පූ. පළමුවන සියවසේ දී පමණ
ii ක්‍රි. වර්ෂ 250 දී පමණ
iii ක්‍රි. ව. පළමුවන සියවසේ දී පමණ
iv ක්‍රි.පූ. 250 දී පමණ

20. පැරණි ආහාර රටාව තුළ දියාරු නොවූ අතින් ගෙන අනුභව කළ හැකි පදමට සකස්කර ගත් ව්‍යංජනය හැඳින්වූයේ කුමන නමකින් ද?

i නියඹලාව
ii ඇඹුල
iii ආනම
iv හොද්ද

21. මියුරන් කොමිසම විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශයක් වන්නේ මින් කුමක් ද?

i රාජකාරී ක්‍රමය  නැවත ඇති කිරීම
ii ගම්සභා අහෝසි කිරීම
iii පොල් ගස් බද්ද වැනි අලුත් බදු පැනවීම
iv ලන්දේසි උසාවි ක්‍රමය නැවත පිහිටුවීම

22. මිෂනාරී සංවිධාන ලෙස හැඳින්වෙන්නේ

i අධ්‍යාපන කටයුතු සිදු කළ සංවිධානයි    ii කිතු දහම ප්‍රචාරය කළ සංවිධානයි

iii දේශපාලන කටයුතු සිදු කළ සංවිධානයි    iv වෙළඳාම කළ සංවිධානයි

23. ක්‍රි. ව. 1848 අරගලයෙන් පසු බ්‍රිතාන්‍ය ආණ්ඩුව විසින් මුලමනින්ම ඉවත් කළ බදු වර්ගය කුමක් ද?

i පොල් ගස් බද්ද හා මුද්දර බද්ද    ii තුවක්කු බද්ද හා ඔරු බද්ද

iii වෙළෙඳසැල් බද්ද හා බලු බද්ද    iv මුද්දර බද්ද හා ඔරු බද්ද

24. ඕල්කට්තුමාගේ මඟ පෙන්වීම යටතේ පිහිට වූ කොළඹ පරම විඥාර්ථ බෞද්ධ සංගමයේ ප්‍රධාන අරමුණක් වූයේ

i රටපුරා පන්සල් ආරම්භ කිරීමය

ii බෞද්ධ පොත්පත් රචනා කිරීමය

iii ගමින් ගමට ගොස් බෞද්ධ ආගම පිළිබඳව දැනුවත් කිරීමය

iv බෞද්ධ පාසල් පිහිටුවීමය

25. යාපනයේ හින්දු විද්‍යාලය වශයෙන් වර්තමානයේ හඳුන්වන්නේ හින්දු ආගමික පුනරුද සමයේ ඇති කළ කුමන ආයතනයක් ද?

i ශිවන්ගල විද්‍යාලයයි    ii ශෛව පරිපාලන සභාවයි

iii ශෛව ප්‍රකාශ විද්‍යාලයයි    iv රාම නාදන් විද්‍යාලයයි

26. කෝල්බෲක් ප්‍රතිසංස්කරණ යටතේ ව්‍යවස්ථාදායක හා විධායක සභා පිහිටුවීමේ ප්‍රධාන අරමුණ වූයේ

i දේශීය ජනතාවට පාලන බලතල ලබාදීමයි

ii විවිධ ජනවර්ගවලට පාලන බලතල ලබාදීමයි

iii ආණ්ඩුකාරයාට පක්ෂපාතී පිරිසකට බලතල ලබාදීමයි

iv ආණ්ඩුකාරයාගේ බලතල අඩු කිරීමයි

27. * වතුවගාවට අවශ්‍ය යටිතල පහසුකම් දියුණු කිරීම

* ව්‍යවස්ථාදායක සභාවේ නිල නොලත් පිරිස සුළුතරය වීම

* නිල නොලත් පිරිස ආණ්ඩුකාරයා විසින් නම් කිරීම

ඉහත කරුණු මුල් කර ගෙන උද්ඝෝෂණ ව්‍යාපාරයට දායක වූ සංගමය කුමක් ද?

i පහතරට නිෂ්පාදන සංගමය    ii ලංකා සංගමය

iii ලංකා ජාතික සංගමය    iv හලාවත සංගමය

28. A රාජ්‍ය නිලධාරීන් තිදෙනෙකු පත් කිරීම

B පළාත් බද නියෝජනය හඳුන්වා දීම

C සීමිත ඡන්ද බලය ලබා දීම

D දිවයින පළාත් පහකට බෙදීම

ඉහත සඳහන් යෝජනා ඉදිරිපත් කළ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

i ඩොනමෝර්, මැකලම්, මැනිං හා කෝල්බෲක්

ii මැනිං, මැකලම්, සෝල්බරි හා ඩොනමෝර්

iii ඩොනමෝර්, මැනිං, මැකලම් හා කෝල්බෲක්

iv මැකලම්, කෝල්බෲක්, මැනිං හා ඩොනමෝර්

29. පොපි මල් ව්‍යාපාරයට එරෙහිව ආරම්භ වූ සූරියමල් ව්‍යාපාරය තුළින් ලැබූ මුදල් යොදවනු ලැබුවේ කුමන කාර්යයක් සඳහා ද ?

i ලාංකීය දුප්පත් ජනතාවගේ සුභ සිද්ධියට

ii සේවා මුක්ත භට කණ්ඩායම් වල සුභ සිද්ධියට

iii බ්‍රිතාන්‍ය සොල්දාදුවන්ගේ පවුල්වලට ආධාර කිරීම සඳහා

iv නිදහස් සටන් ව්‍යාපාරය සඳහා

30. වතු වගා කටයුතු වලට ශ්‍රමය සැපයූ කම්කරුවන් අනිවාර්ය සේවා රාජකාරි කටයුතුවලින් නිදහස් කරමින් කෝපි වගාවේ උන්නතිය උදෙසා කටයුතු කරන ලද ආණ්ඩුකාරවරයා කවුරුන් ද?

i වයිකවුන් ටොරින්ටන්

ii හර්කියුලිස් රොබින්සන්

iii රොබට් වාමස්

iv එඩ්වඩ් බාන්ස්

31. ශ්‍රී ලංකාවේ රබර් වගාව දියුණු කිරීම සඳහා රබර් පර්යේෂණ ආයතනයක් පිහිටුවන ලද්දේ කුමන ප්‍රදේශයේ ද?

i කලුතර

ii ලුණුවිල

iii අගලවත්ත

iv කෑගල්ල

32. පහත අ සහ ආ තීරු දෙකෙහි දක්වා ඇති තොරතුරු නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| අ | ආ |
|---|---|
| i ජෝන් මැකඩම් | A ස්ථාන දෙකක් අතර පණිවිඩ හුවමාරුව |
| ii ඇඩම් ස්මිත් | B රාජ්‍ය නිර්බාධවාදී සංකල්පය |
| iii සැමුවෙල් මෝර්ස් | C ගල් අතුරා තාර දැමීමේ ක්‍රමය |
| iv ඒබ්‍රහම් ඩර්බි | D ගල් අඟුරු යොදා යපස් උණු කිරීම |

i A D B C    ii C B A D    iii C D B A    iv D C B A

* පහත 33 හා 34 ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචනය දී ඇති පිළිතුරු අතරින් තෝරන්න.

33. ලංකාවේ දුම්රිය මාර්ග ඉදි කිරීම ආරම්භ වන්නේ .................. ආණ්ඩුකාරවරයාගේ කාලයේ දීය.

i එඩ්වඩ් බාන්ස්

ii ෆෙඩ්රික් නෝර්ත්

iii හෙන්රි වෝඩ්

iv හෙන්රි බෙස්මර්

34. ආකරවලට ආලෝකය ලබා දීමේ ගැටළුව .................... විසින් ආරක්ෂක ලාම්පුව නිපදවීමත් සමග නිරාකරණය විය.

i හම්ප්‍රි ඩේවි　　ii ඒබ්‍රහම් ඩර්බි

iii විලියම් සීමන්ස්　　iv හෙන්රි බෙස්මර්

35. සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ අගමැති කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියා වූ අතර අගමැතිවරයා යටතේ පවත්වාගත යුතු අමාත්‍යංශ දෙක වූයේ

i ආරක්ෂක හා විදේශ කටයුතු　　ii වරාය හා නාවික කටයුතු

iii විදේශ හා වෙළඳ කටයුතු　　iv ආරක්ෂක හා අධිකරණ කටයුතු

36. 1972 ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් නීති සම්පාදනය කිරීමේ කටයුතු පැවරුන ආයතනය හැඳින්වූයේ

i ව්‍යවස්ථාදායක සභාව නමිනි　　ii ජාතික රාජ්‍ය සභාව නමිනි

iii පාර්ලිමේන්තුව නමිනි　　iv රාජ්‍ය මන්ත්‍රණ සභාව නමිනි

* පහත A B C D වලින් දැක්වෙන පද යුගල අධ්‍යයනය කර 37 - 40 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - 1 පැරණි ප්‍රභූ පන්තිය
　2 නව මධ්‍යම පන්තිය

B - 1 කම්කරු පන්තිය
　2 මධ්‍යම පන්තිය

C - 1 මිෂනාරි පාසල්
　2 බටහිර සංස්කෘතිය

D - 1 බ්‍රිතාන්‍ය පාලනය
　2 ස්වයං පෝෂිත ආර්ථික රටාව

E - 1 කෝල්බෲක් ප්‍රතිසංස්කරණය
　2 ඉංග්‍රීසි අධ්‍යාපනය

37. පළමුවැන්නේ බලපෑමෙන් දෙවැන්නෙහි වර්ධනය සිදු වූ පද යුගලය කුමක් ද?

i A　　ii B　　iii C　　iv E

38. පළමුවැන්නේ පිරිහීම හා දෙවැන්න බිහිවීම සිදු වූ පද යුගලය කුමක් ද?

i A　　ii B　　iii D　　iv E

39. දෙවැන්නේ ආරම්භයට හා වර්ධනයට පළමුවැන්න හේතු වූ පද යුගලය කුමක් ද?

i B　　ii C　　iii D　　iv E

40. පළමුවැන්න නිසා දෙවැන්න විනාශවීම සිදු වූ පද යුගලය කුමක් ද?

i A　　ii B　　iii C　　iv D

කැලණිය අධ්‍යාපන කලාපය

දෙවන වාර පරීක්ෂණය - 2017

| | | |
|---|---|---|
| 11 ශ්‍රේණිය | ඉතිහාසය - 11 | පැය 03 යි |

1 කොටස

සැලකිය යුතුයි

* පළමුවන කොටසේ පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.

* 11 කොටසින් ප්‍රශ්න හතරකට ද 111 කොටසින් ප්‍රශ්න එකකට ද පිළිතුරු සපයන්න.

* පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

01 (අ) පහත i යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද ii යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ද ලකුණු කර නම් කරන්න.

i කැලණි ගඟ, හුරුළු වැව, ගොඩවාය, හලාවත, මහනුවර, මඩකලපුව, පාහියන්ගල, දඹදෙණිය, පොළොන්නරුව, දෙවි නුවර, පල්ලව වංක, බුන්දල

( ලකුණු 12 )

ii මලය අර්ධ ද්වීපය, රෝමය, ගෝව, තායිලන්තය, පර්සියන් බොක්ක, කල්කටා

( ලකුණු 06 )

(ආ) i පහත A B C D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු හා සම්බන්ධ පුද්ගලයින් / ස්ථාන නම් කරන්න.

A පළමුවන පරාක්‍රමබාහු රජුගෙන් පසු පොළොන්නරුවේ ශක්තිමත් පාලනයක් ගෙනගිය රජතුමා -

B ඉතාලියේ පුනරුද සමයේ නව චිත්‍ර කලාවක් බිහිකල මධ්‍යස්ථානය -

C යාපනය රාජධානියේ පාලන කටයුතු මෙහෙය වූ රජ පෙළපත -

D දෙවන රාජසිංහ රජු සමඟ 1638 ගිවිසුම ඇති කරගත් ලන්දේසි නාවික හමුදා නිලධාරියා

( ලකුණු 04 )

* A හා B වශයෙන් දක්වා ඇති පිංතූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

A



1 A රූපයේ දැක්වෙන්නේ කුමන ගොඩනැගිල්ලක් ද ?

2 එය පිහිටා ඇති ප්‍රදේශය කුමක් ද ?

3 එය කුමන සියවසකට අයත් ද?

4 මෙහි සිදු කර ඇති විශේෂ කාර්ය කුමක් ද ?

( ලකුණු 04 )

B



1 B රූපයේ දැක්වෙන්නේ කුමන ගොඩනැගිල්ලක් ද ?

2 එය පිහිටා ඇත්තේ කුමන රටේ ද ?

3 මෙය අයත් වන්නේ කුමන සමයකට ද?

4 මෙම ගොඩනැගිල්ලේ දැකිය හැකි විශේෂ ලක්ෂණයක් ලියා දක්වන්න ?

( ලකුණු 04 )

## II කොටස

2. i රාජ්‍යත්ව සංකල්ප තුනක් සඳහන් කරන්න. ( ලකුණු 03 )

ii රජු විසින් රට වැසියාට ඉටු කළ යුතු කාර්යයන් දෙකක් සඳහන් කරන්න. ( ලකුණු 04 )

iii දුටුගැමුණු රජුගේ සේවාව කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. ( ලකුණු 05 )

iv ලංකා ඉතිහාසයේ ශ්‍රේෂ්ඨ රජෙකු වශයෙන් වසභ රජතුමා සැලකීමට හේතු වන කරුණු තුනක් ඉදිරිපත් කරමින් පැහැදිලි කරන්න. ( ලකුණු 06 )

3. i බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ ප්‍රයෝජනය සඳහා නිර්මාණය වූ පොකුණු තුනක් නම් කරන්න.( ලකුණු 03 )

ii මහ වැව් ඉදි කිරීමෙන් බලාපොරොත්තු වූ අරමුණු දෙකක් සඳහන් කරන්න. ( ලකුණු 04 )

iii වැව් බැම්ම සකස් කිරීමේ දී අතීත වාරි ශිල්පීන් දක්වා ඇති නිපුණතාවය කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. ( ලකුණු 05 )

iv සීගිරි සංකීර්ණය නිර්මාණය කිරීමේදී යොදා ගෙන ඇති කලාත්මක හා තාක්ෂණික අංග තුනක් උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න. ( ලකුණු 06 )

4. i මහනුවර රාජධානියේ මුල් පාලකයින් තිදෙනා නම් කරන්න.( ලකුණු 03 )

ii පහත A B C D යටතේ දැක්වෙන ඓතිහාසික තොරතුරුවලට අදාළ පුද්ගලයින් නම් කරන්න.

A දෙවන රාජසිංහ නමින් උඩරට රජ වූ කුමාරයා

B පෘතුගීසින් සමඟ මුල්ලේරියා වෙලේ සටන් කළ කුමාරයා

C උඩරට රජ වූ නායක්කර් වංශික ප්‍රථම රජු

D විජයබා කොල්ලයෙන් පසු කෝට්ටේ රාජධානිය භාරගත් රජු ( ලකුණු 04 )

iii පළමුවන විමලධර්මසූරිය රජතුමා බලයට පැමිණීමෙන් පසු මුහුණපෑමට සිදු වූ අභියෝග දෙකක් විස්තර කරන්න. ( ලකුණු 05 )

iv කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා බුදු දහමට කරන ලද සේවාව කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. ( ලකුණු 06 )

5. i ඉංග්‍රීසින් මුහුදුබඩ ප්‍රදේශ යටත් කර ගැනීමට පෙර උඩරටට යැවූ දූතයින් තිදෙනා නම් කරන්න.( ලකුණු 03 )

ii ක්‍රි:ව: 1797 දී ඉංග්‍රීසින්ගේ වෙළඳ සමාගමට එරෙහිව කැරැල්ලක් ඇතිවීමට බලපෑ හේතු දෙකක් සඳහන් කරන්න. ( ලකුණු 04 )

iii ඉංග්‍රීසින්ට උඩරට රාජධානිය යටත් කර ගැනීමට අවශ්‍යවීමට බලපෑ හේතු දෙකක් විස්තර කරන්න.

(ලකුණු 05 )

iv දිගු කලක් ස්වාධීනව පැවති උඩරට රාජධානිය ඉංග්‍රීසීන්ට යටත් කර ගැනීමට හැකි වූයේ කුමන හේතු නිසාදැයි කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. ( ලකුණු 06 )

6. i ලංකාවේ තම ආගම පැතිරවීමට කටයුතු කළ මිෂනාරි සංගම් තුනක් සඳහන් කරන්න.( ලකුණු 03 )

ii පහත A B C D යටතේ දැක්වෙන තොරතුරු සපයන්න.

A 1862 දී ගාල්ලේ පිහිටුවන ලද මුද්‍රණාලය

B ඕල්කට්තුමාගේ මූලිකත්වයෙන් 1880 දී පිහිටවූ සමාගම

C අනුරාධපුර පූජනීය ස්ථාන රැකගැනීමේ ව්‍යාපාරයක් ආරම්භ කළ පුද්ගලයා

D කොළඹ සහිරා විද්‍යාලය පිහිට වූ මුස්ලිම් ජාතිකයා ( ලකුණු 04 )

iii ඉංග්‍රීසීන්ගේ ආගමික ව්‍යාපාරයට එරෙහිව හින්දු ආගමික පුනර්ජීවනය වෙනුවෙන් හින්දුන් කටයුතු කළ ආකාරය කරුණු දෙකක් ඉදිරිපත් කරමින් විස්තර කරන්න. ( ලකුණු 05 )

iv බෞද්ධ පුනරුද ව්‍යාපාරය ක්‍රියාත්මක වූ ආකාරය කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. ( ලකුණු 06 )

7. i ලංකාවේ තේ වගාව සම්බන්ධ පහත A B C යටතේ අසා ඇති තොරතුරු සපයන්න.

A තේ වගාව ආරම්භ කළ පුද්ගලයා

B වතුකරුවන් පුහුණුව සඳහා යැවූ ප්‍රදේශය

C තේ පර්යේෂණාගාරය පිහිටි ප්‍රදේශය ( ලකුණු 03 )

ii ලංකාවේ තේ වගාව දියුණුවීමට බලපෑ හේතු දෙකක් ලියා දක්වන්න. ( ලකුණු 04 )

iii බ්‍රිතාන්‍ය පාලන කාලය තුළ මෙරට සමාජයේ සිදුවූ වෙනස්කම් දෙකක් විස්තර කරන්න. ( ලකුණු 05)

iv බ්‍රිතාන්‍ය පාලනය නිසා අපට උරුම වූ යහපත් හා අයහපත් බලපෑම් තුනක් පැහැදිලි කරන්න. ( ලකුණු 06 )

## 111 කොටස

8. i පුනරුද සමයේ සාහිත්‍ය සේවාවන් කළ ඉතාලි ජාතික ගත්කතුවරු තිදෙනෙකු නම් කරන්න.( ලකුණු 03 )

ii පුනරුදය ඇතිවීමට බලපෑ හේතු දෙකක් සඳහන් කරන්න. ( ලකුණු 04 )

iii පුනරුද සමයේ ඇති වූ දේශපාලන වෙනස්කම් දෙකක් විස්තර කරන්න. ( ලකුණු 05)

iv යුරෝපා ජාතීන්ට දේශගවේෂණ ව්‍යාපාරය සාර්ථක කර ගැනීමට ඉවහල් වූ සාධක තුනක් පැහැදිලි කරන්න. ( ලකුණු 06 )

9. i කාර්මික විප්ලවයේ බලපෑමට ලක් වූ ප්‍රධාන කර්මාන්ත තුන නම් කරන්න.( ලකුණු 03 )

ii බ්‍රිතාන්‍යයේ කාර්මික විප්ලවය ඇතිවීමට බලපෑ හේතු හතරක් සඳහන් කරන්න. ( ලකුණු 04 )

iii කාර්මික විප්ලවය නිසා ප්‍රවාහන ක්ෂේත්‍රයේ සිදු වූ වෙනස්කම් කෙටියෙන් විස්තර කරන්න. ( ලකුණු 05)

iv යහපත් හා අයහපත් ප්‍රතිඵල රාශියක් ඇති කිරීමට කාර්මික විප්ලවය සමත් විය. මෙය කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. ( ලකුණු 06 )



